**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ2021දෙසැම්බර් 31 දිනටමූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහර්ට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 43 වන වගන්තියට අනුව පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදී පිළිගත් හා අදාල වෘත්තිය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කලයුතු වුවත්, ප්‍රධාන ලිපිකරු, පරිපාලන නිලධාරි හා වෙනත් ආයතනයක තාක්ෂණික නිලධාරියකුගෙන් සමන්විත මණ්ඩලයකින් තක්සේරු කර තිබුණි. තවද, ප්‍රමිතයේ 52 වන වගන්තියට අනුව ප්‍රත්‍යාගණන ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරන අගය වැඩිවන විටක, එම වැඩිවීම ඍජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කල යුතු වුවද, එම ප්‍රමාණය වෙනත් සංචිත ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී සිදුකරන ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු සඳහා ලිඛිත ඉල්ලීමක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත සිදුකර නිලධාරියෙකු ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාමර බෙදා වෙන්කිරිමේ කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවා තිබුණු රු.2,428,510 ක්වූ වැඩ වටිනාකම කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට ගොඩනැගිලි හා ඉදිකිරිම් ලෙස දක්වා තිබුණි. එම නිසා ගොඩනැඟිලි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. තවද, මෙම කෙරීගෙන යන වැඩ වටිනාකම සහතික කිරිමට අදාල මිණුම්පත්‍ර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම සේදුම් කාමරය ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව සඳහා ගෙවන ලද එකතුව රු.868,837 ක් කෙරිගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ඒ සඳහා සහතික කල වැඩ පත්‍රිකා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2021.07.27 වන විට කාමර බෙදා වෙන් කිරීම කාර්යයෙහි 70% ක වැඩ අවසන් කර ඇති බව තාක්ෂණික නිර්දේශ වලින් තහවුරු වී ඇත. එම 70% ක කාමර බෙදා වෙන් කිරීම් කොටස භාවිතය සඳහා ද යොදාගෙන තිබූ බැවින් ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර ඇත. තවද එය භාවිතයට ගෙන තිබූ මාස 5ක කාලය සඳහා ක්ෂය කිරීම් ද සිදුකර ඇති බව සඳහන් කරමි. කෙසේ වෙතත් මේ වන විට එම කාර්යය 100% ක්ම අවසන් කර ප්‍රයෝජනයට ගන්නා බවත් වැඩිදුරටත් සඳහන් කරමි. | ගොඩනැගිලි ඉදිකිරිම් කටයුතු නිමකර භාවිතයට ගන්නා තෙක් කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර ඉදිකිරිම්වලට අදාල උපයෝගි ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 2018 හා 2019 වර්ෂවලදි ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබූ වෙබ් අඩවිය සඳහා දරන ලද රු. 614,800 පිරිවැය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කිරිමට සමාලෝචිත වර්ෂය තුලදීද, කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් වර්ගිකරණයන් නිවැරදි කර ගිණුම් ගැලපීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ II කොටසේ 13 (3) වගන්තිය | වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිළධාරියා වුවත්, ඔහු කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු නොවුවද, සභාවේ චෙක්පත් අත්සන් කිරීමේ කාර්යයේ නිරතවී ඇති බව නිරීක්ෂණය විය. | රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ගිණුම විවෘත කර ඇත්තේ "සභාපති, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව" යන නාමයෙනි. එබැවින් මෙම ගිණුම ආරම්භ කළ දින සිට සභාපතිගේ අත්සන ගිණුමට ලබාදී ඇති අතර චෙක්පත් අත්සන් කිරීමද සිදුකර ඇත. | කොමිෂන් සභා පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය | කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | 2021 අයවැය වාර්තා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත්තේ 2021 පෙබරවාරි මාසයේය. ඉන්පසුව එය රේඛීය අමාත්‍යාංශ සහ මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. විගණනයෙන් පෙන්වා ඇති පරිදී මුදල් වර්ෂය ආරම්භ වන දින සිට 15කට ප්‍රථම කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 552,524 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,835,397 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,387,921 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ වියදම් රු. 3,960,849 කින් වැඩි වුවද භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ලැබීම් රු.6,404,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිත්‍යානුකූලව ගොඩනැගිලි ගිවිසුමට එළඹීමට පෙර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ නිල කාමරයට යාබදව සේදුම් කාමරයක් ඉදිකිරිම වෙනුවෙන් වටිනාකම රු. 1,251,126 ක්වූ (වැට් සහිත) ගිවිසුමකට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව එළඹ තිබුණු අතර සේදුම් කාමරය ඉදිකිරිම වෙනුවෙන් වැය කරනු ලබන මුදල නැවත අයකරගන්නා ආකාරය සම්බන්ධයෙන් නගර සභාව සමඟ එකඟතාවයකට පැමිණ නොසිටීමෙන් එම මුදල් නැවත අයකර ගැනීම ගැටළු සහගත බව විගණනයේදි නිරික්ෂණය විය. | මෙම ගොඩනැගිල්ල දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගැනීමට සැලසුමක් ඇත. ඒ අනුව වත්කමක් ලෙස සේදුම් කාමරය දීර්ඝ කාලයක් කොමිෂන් සභාවට ප්‍රයෝජනයට ගැනීමට හැකි වේ. | ඉදිකිරිම් සිදුකිරිමට පෙර නිත්‍යානුකූලව ගිවිසුම්වලට එළඹිය යුතුය. |
| (ආ) 2017 වර්ෂයේදී කොමිෂන් සභාව ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමේදී කාර්යාලීය වෙන් කිරිම්, විදුලි පද්ධතිය, කාපට් යෙදීම, වායු සමීකරණ, අභ්‍යන්තර දුරකථන පද්ධතිය වෙනුවෙන් රු. 2,687,043 ක වියදමක් දරා තිබුණි. එසේ තිබියදී වසර 4කට පසුව නැවතත් වෙනත් ස්ථානයක කොමිෂන් සභාව ස්ථාපිත කිරිමට ආපසු අයකරගත නොහැකි රු.4,720,427 ක වියදමක් දරා ඇති බව විගණනයේදි නිරික්ෂණය විය. | කොමිෂන් සභාව වර්තමාන කාර්යාල පරිශ්‍රයේ දීර්ඝ කාලයක් පවත්වා ගැනීමේ හැකියාවක් ඇත. එබැවින් මෙම කාර්යාල පරිශ්‍රය සඳහා දරන ලද වියදම කොමිෂන් සභාවේ කාර්යාලය සඳහා සිදුකරන ලද දීර්ඝකාලීන ආයෝජනයක් ලෙස සැලකිය හැකිය. | නිසි පරිදි වියදම් කළමනාකරණය කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2021 නොවැම්බර් මස 01 වන දින ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව සමඟ ගිවිසුම්ගත වී තිබුණද, ඊට ප්‍රථමයෙන් කාර්යාල බෙදීම් කටයුතු සඳහා ආයතනයක් සමඟ වටිනාකම රු.3,469,301 ක (වැට් සහිත) ගිවිසුමකට එළඹ රු. 1,697,737 ක මුදලක් ගෙවීම් කර තිබුණද, මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හෝ ලබාගෙන නොතිබුණි. | කාර්යාල බෙදීම් සිදුකිරීම සඳහා සහරා කන්ස්ට්‍රක්ෂන් ආයතනය තෝරාගැනීමට අදාල ටෙන්ඩර් තීරණය සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඇත. කාර්යාල බෙදීම්වලට අදාල ටෙන්ඩර් තීරණය කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කිරීමටද ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | අදාල අනුමැතින් ලබාගැනීමෙන් පසුව පමණක් ගෙවීම් කිරිමට කටයුතු කල යුතුය. |